**ශීර්ෂය 401- ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝබර් 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
-

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

2020 අගෝස්තු 09 වැනි දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරනු ලැබ ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා අනුරූප වන බවට මා ප්‍රකාශ නොකරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.3,334,850 ක් වූ බදු නොවන ආදායම් හා වෙනත් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණු අතර ඒසීඒ–1 ආකෘතිය මගින් ඉදිරිපත් කර ද නොතිබුණි. | බදු නොවන ආදායම් වෙනත් ලැබීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කළයුතු ඒසීඒ-1 ආකෘතිය අතපසුවීමකින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර නොමැත. එහි ඇතුළත් කළ යුතු ආදායම රු. 3,334,850 ඒසීඒ F ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ සඳහන් කර ඇත. | ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |

### 1.6.2 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.3,334,850 ක් වූ බදු නොවන ආදායම් හා වෙනත් ලැබීම් වෙනුවට ආදායම් නොවන ලැබීම් රු.3,893,593 ක් දක්වා තිබීම හේතුවෙන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.558,743 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.558,743 ක් භාණ්ඩාගාර අග්‍රිම යටතේ සඳහන් නොකර වැරදීමකින් වෙනත් ලැබීම් යටතේ ගිණුම්ගත කර ඇත. | ආදායම් හා අග්‍රිම ලැබීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |

### 1.6.3 අක්මුදල් ගැලැපුම් ගිණුම

අක්මුදල් ගැලැපුම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.471,556,177 ක් වූ ගැලපීම් කිරීමට පෙර අක්මුදල් ශේෂය රු.470,997,434 ක් ලෙස දක්වා තිබීමෙන් එම ශේෂය රු.558,743 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | රු. 558,743 ක භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ඒසීඒ F ආකෘතියේ වෙනත් ලැබීම් යටතේ ගිවිසුම්ගතකර ඇති බැවින් එම මුදල ගැලපීම් කිරීමට පෙර අක් මුදල් ශේෂයට ඇතුළත් කර ඇත. | අක්මුදල් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |
| (ආ) | රු.450,860,602 ක් වූ වෙනත් වැය ශීර්ෂයන්ගෙන් හර කිරීම් රු.448,224,342 ක් ලෙස දක්වා තිබීමෙන් එම ශේෂය රු.2,636,260 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | -එම- |
| (ඇ) | රු.23,817,234 ක් වූ තැන්පතු ලැබීම් රු.23,824,684 ක් ලෙස දක්වා තිබීමෙන් එම ශේෂය රු.7,450 ක් වැඩියෙන් පෙන්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය වටිනාකම රු.105,974,850 ක් වුවත් එම වටිනාකම රු.106,533,594 ක් ලෙස දක්වා තිබීමෙන් එම මුදල් ප්‍රවාහය රු.558,744 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රමාණය රු. 106,533,594 ක් ලෙස දක්වා ඇත. එහි භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.558,744 ක මුදල ඇතුළත් වී ඇත. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.65,253,599 ක් වුවද එය රු.65,402,556 ක් ලෙස දක්වා තිබීමෙන් එම මුදල් ප්‍රවාහය රු.148,597 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර මුදල් ගලායාම නියමිත පරිදි වර්ගීකරණය කර දක්වා ද නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) රු.3,797,142ක් වූ තැන්පතු ලැබීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ රු.3,789,692ක් ලෙස දක්වා තිබීමෙන් එම මුදල් ප්‍රවාහය රු.7,449 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2020 අලුතින් ඇති කරන ලද වන බැවින් රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම හා උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන් රාජකාරි සඳහා යොදවා ඇති බැවින් ඇප තැන්පතු ලේඛනයක් පවත්වා නොතිබිණි. ඉදිරියේදී එම ලේඛණ නඩත්තු කිරීමට කටයුතු යොදන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මෙම ලේඛනය ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරන ලබන බව කාරුණික දන්වමි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 502 අනුව, සාමාජික ණය ලේඛණය (CC-10) ට සියලුම සේවකයන්ගේ ණයශේෂ ඇතුලත් කළ යුතු වුවද, රු.225,390ක් වූ ආපදා ණයශේෂයක් ඇතුලත් කර නොතිබුණි. | අදාල ණය ශේෂය වන රු.225,390 ක මුදල 2021 ණය ලේඛණයේ ඇතුළත්ව ඇත. මෙම ණය ශේෂය 2021 ජනවාරි මස සිට අයකරනු ලබයි. | මුදල් රෙගුලාසි 502 ප්‍රකාරව සාමාජික ණය ලේඛණයට සියලුම සේවකයන්ගේ ණයශේෂ ඇතුලත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 07 දින සිට රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය නම් වූ ආයතනය පවත්වාගෙන යාමට ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණි. මේ සඳහා 2020 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා වූ බදු කුලී වියදම් රු.6,640,000ක් අතිරේක ලේකම්වරයාගේ අනුමැතියෙන් අංක 401-01-02-1404 දරන රාජ්‍ය අමාත්‍යාංශ බදුකුලී හා පළාත් පාලන ආයතන බදු වැය විෂය මගින් දරා තිබුණි. | ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/සීඑස්ඒ/00/1/6/1 හා 2020.10.07 දිනැති ලිපිය මගින් මෙම ආයතනය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු පිලිබද රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට දන්වා ඇත. අයවැය දෙපාර්තුමෙන්තුව විසින් 2020 වර්ෂය සඳහා වූ මෙම ආයතනයට අදාල ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්වලට අදාල ප්‍රතිපාදන ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු පිලිබද<br><br>රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වෙන් කර ඇත. ඒ අනුව අයවැය දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කිරීම් යටතේ ගොඩනැගිලි කුලී ඇතුළු මෙම ආයතනයේ හිග ගෙවීම් ඇතුළුව වියදම් ගෙවීම් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු පිලිබද රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන ලදී. | රාජ්‍ය අමාත්‍යාංශ වැය විෂය මගින් දරා තිබූ වියදම අදාල ආයතනයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට පැවරි තිබූ රන්මිණිතැන්න ටෙලි සිනමා උද්‍යානයේ 2019 දෙසැම්බර් මාසයට අදාළ පවිත්‍රතා වියදම වූ රු.689,054 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණු අතර අදාල වියදම එකී අමාත්‍යාංශයෙන් පියවාගැනීමට කටයුතු කර නොතිබුණි. | මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය, තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති කාලය තුළ ප්‍රතිපාදන ගැටළුවක් හේතුවෙන් උක්ත ගෙවීම් සිදු කර නොතිබූ අතර 2019 දෙසැම්බර් මාසය වන විට නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට පැවරී ඇත. නමුත් උක්ත කාලයට අදාලව පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු.689,054 ක මුදල ගෙවා නැත. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන | වියදම අදාල අමාත්‍යාංශයෙන් පියවාගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත් වන අවස්ථාවේ දී නොගෙවූ බිල්පතක් ලෙස උක්ත වවුචරය මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය වෙත යොමු කර ඇත. ඒ අනුව අදාල ආයතනයට ගෙවිය යුතු උක්ත වවුචරයේ සදහන් රු.689,054 ක මුදල 2020 වර්ෂය සඳහා ආයතනයට වෙන් වූ පුනරාවර්ථන වියදම් ප්‍රතිපාදන මගින් ගෙවා ඇත. | |
| (ඇ) | වැය විෂයන් 2 ක් සඳහා සලසා තිබූ රු.450,000 ක් හා රු.150,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. අදාල ප්‍රතිපාදන වෙන්කරගෙන තිබූ, පිළිවෙලින් ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම සහ යන්ත්‍ර පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම යන කාර්යයන් ආරම්භ කිරීමට උත්සාහයක් හෝ දරා නොතිබූ අතර ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වශයෙන් නව අමාත්‍යාංශයක් ලෙස පිහිටුවීම, කෝවිඩ්-19 තත්වය සහ මානව හා භෞතික සම්පත්වල ඌණතාවය දක්වා තිබුණි. | මෙම අමාත්‍යාංශය අංක 2187/27 හා 2020.08.09 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපනය කර ඇත. 2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් හා නිලධාරීන්ගේ ඌණතාවය හේතුවෙන් කළමණාකරණ සහකාර නිලධාරීන් වෙනුවට උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන් සේවයේ යෙදවීම වැනි හේතු මත මෙම තත්ත්වය ඇති වී තිබේ. | අවශ්‍යතා සඳහා පමණක් ප්‍රතිපාදන සලස්වා ගත යුතුය. |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------------- | ------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 18 කට අදාලව රු.2,343,304 ක ශේෂයක් දක්වා තිබුණද එකී බැරකම්වලට අමතරව 2021 ජනවාරි හා පෙබරවාරි මාසවලදී 2020 වර්ෂයට අදාලව පුනරාවර්තන වැය විෂයයන් 4 යටතේ රු.2,097,478ක් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල මුළු බැදීම් හා බැරකම් රු.2,097,478ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම සාදන අවස්ථාව දක්වා ලැබී තිබූ බැදීම් හා බැරකම් ගිනුමට ඇතුළත් කර ඇති අතර ඒ අතරතුර ලැබුණු බැදීම් හා බැරකම් ගිණුමට ඇතුළත් කර නොමැති බව කාරුණිකව දන්වමි. | ගෙවිය යුතු සියලු අගයන් බැරකම් ප්‍රකාශයට ඇතුලත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව පුනරාවර්තන වැය විෂයයන් 2 කට අදාල රු.203,575 ක හා මූලධන වැය විෂයයන් 1 කට අදාල රු.30,500 ක ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා පිළිවෙලින් රු.138,131ක හා රු.483,491ක බැරකම් වලට එළඹ තිබුණි. | මු.රෙ. 94(02) අනුව එම බැඳීම් ඇති කරගෙන ඇති බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා බැරකම් වලට නොඑළඹීමට කටයුතු කල යුතුය. |

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මානව සම්පත්වල පවතින ඌණතාවය හේතුවෙන් එම කටයුතු ප්‍රමාද වූ බව ද, ඉදිරියේදි නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ද කාරුණිකව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.2. ඡේදය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත යවා තිබූ විගණන විමසුම් 04 සඳහාම පිළිතුරු ලබා දි නොතිබුණි. | මානව සම්පත්වල පවතින ඌණතාවය හේතුවෙන් එම කටයුතු ප්‍රමාද වූ බව ද, ඉදිරියේදි නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ද කාරුණිකව දන්වමි | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙක් අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් කර නොමැති අතර මු.රෙ 71 මගින් ඉදිරියේදී එම තනතුර ඇති කිරීමට කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව දන්වමි. | -එම- |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) | 2020 වර්ෂය සඳහා තොග හා වත්කම් සමීක්ෂණය කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 අලුතින් ඇති කරනලද රාජ්‍ය අමාත්‍යංශයක් බැවින් හා නිලධාරීන්ගේ ඌණතාවය හේතුවෙන් තොග හා වත්කම් සමීක්ෂණ කටයුතු සිදු කර නොමැත. ඉදිරියේදී මෙම තත්ත්වය මගහරවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 30 දිනැති අංක 2019/25 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2020 වර්ෂය සඳහා සේවකයින් 9 කට ලබාදුන් විශේෂ අත්තිකාරම් රු.4,000 ක් 2020 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි. | 2020 වර්ෂය සඳහා සේවකයන් 09 දෙනෙකුට ලබා දුන් විශේෂ අත්තිකාරම් මුදල් රු.4000 මුදල මේ වන විට අයකර අවසන් වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොමැත. ඉදිරියේදී මෙම තත්ත්වය මගහරවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 ජනවාරි 09 දිනැති අංක SA/AMP/Deposit/Transfer දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබූ ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ රඟහල) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ප්‍රකාරව වෙනම ව්‍යාපෘතියක් ලෙස සැලකිය යුතු වේ. එය නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අයවැය මගින් සලසා ගැනීමටත් උපයන ලද ආදායම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා සුදුසු ආදායම් ශීර්ෂයකට බැර කිරීමටත් කටයුතු කර නොතිබූ අතර අංක 6000-0-0-020-009-0 දරන තැන්පත් ගිණුම මගින් ගණුදෙනු මෙහෙයවා තිබුණි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නෙළුම් පොකුණ රඟහල 2020 අගෝස්තු 09 දින සිට මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතට පැවරී තිබූ අතර රඟහලේ භාවිතය සඳහා අවශ්‍ය භාණ්ඩ තැන්පත් කර ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් පැලියගොඩ ගබඩා සංකීර්ණය රු.236,745ක් වූ මාසික කුලියක් මත 2017 අගෝස්තු 01 සිට 2020 ජූලි 31 දක්වා වසර 03 ක කාල සීමාවකට ලබාගෙන තිබුණි. 2020 සැප්තැම්බර් දක්වා ගබඩා සංකීර්ණයට අදාල හිඟ බදුකුලී ලෙස රු.11,743,287ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණද ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. ලිඛිත ගිවිසුමක් රහිතව හිඟ බදුකුලී ගෙවීමේදී රු.355,395 ක දඩ මුදලක් ද ගෙවා තිබූ අතර 2020 ජූලි දක්වා රු.236,745ක්ව පැවති මාසික කුලිය 2020 අගෝස්තු සිට රු.724,125 දක්වා එනම් සියයට 306 කින් වැඩි කර ගෙවා තිබුණි. | ජාතික ප්‍රසංගික කලා මධ්‍යස්ථානයේ (නෙළුම් පොකුණ) නවීකරණයන්ට අදාළ භාණ්ඩ නාගරික සංවර්ධන අධිකාරියට අයත් පැලියගොඩ ගබඩා සංකිර්ණයේ ගබඩා කර ඇත. 2017.08.01 දින සිට 2020.09.30 තෙක් මාසික කුලී ගාස්තු කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණත්, එවකට අමාත්‍යාංශ ලේකම් එස්.ටී කොඩිකාර මහතා විසින් ගබඩා කර ඇති භාණ්ඩවල වගකීම විධිමත්ව නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමට හැකිවීමත්, රජයේ ආයතනයක් වීමත්, විධිමත් පරිදි ගබඩා සංකීර්ණයේ පහසුකම් ලබා ගැනීමට ගිවිසුම් ගතවීමට කටයුතු කරතිබීම නිසා හිඟ මුදලේ ගෙවීම් කටයුතු සිදු කරන ලදී. මෙම පැලියගොඩ ගබඩා සංකීර්ණය ලබා ගත් අවස්ථාවේ ජාතික ප්‍රසංගික කලා මධ්‍යස්ථානය අයත්ව තිබූ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් | ගබඩා සංකීර්ණය ලබා ගැනීම සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීමට කටයුතු කල යුතු අතර ගෙවා තිබූ දඩ මුදල හා වැඩි කල කුලිය ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | හෝ 2019 නොවැම්බර් මස සිට 2020 අගෝස්තු මස දක්වා එය අයත්ව තිබූ බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් හෝ ගිවිසුමක් සකස් කර නොතිබුණි. එහෙත් මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරිය හා අමාත්‍යාංශය එක්ව ගිවිසුම සකස්කර ඇති අතර මෙම ගිවිසුම ආරම්භක අවසථාවේ සිට බලාත්මක වන පරිදි සකස් කර ඉදිරි සති දෙක තුල අත්සන් කිරීමට කටයුතු කරන බව වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි. | |

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශයේ පැවති හඳුනානොගත් ගෙවීම් රු.227,250 ක් හඳුනාගැනීමට සහ නිවැරදි කිරීමට විගණිත දින තෙක් කටයුතු කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ සියල්ල පරිගනකගත කිරීමේ හා හඳුනා නොගත් ගෙවීම් නිවැරදි කිරීම් කටයුතු මෙම දිනවල සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | හඳුනා නොගත් ගෙවීම් හඳුනාගැනීමට සහ නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

-----------------------------

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ දැක්ම "තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්" ලෙස ස්ථාපිත කරගෙන තිබූ අතර එය රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය, වගකීම් හා අරමුණුවලට අදාලව ස්ථාපිත කරගෙන නොතිබුණි. | අමාත්‍යාංශය පිහිටුවීමට අදාලව නිකුත් කරන ලද ගැසට් නිවේදනයට අනුව ඉදිරියේදී අමාත්‍යාංශයේ දැක්ම සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ | රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය, වගකීම් හා අරමුණුවලට අදාලව දැක්ම ස්ථාපිත කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාර්යසාධන දර්ශක වශයෙන් දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන හා අදිවාසි සංරක්ෂණ වැඩසටහන හඳුනාගෙන තිබුණි. දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා වැය විෂය අංක 401-2-3-2401 යටතේ රු.1,200,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඉන් රු.169,464 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. දර්ශකය ලඟාකර ගැනීමට අදාල කාර්යයන් ඉටුකර නොතිබුණද තථ්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස සියයට 75 ක් වශයෙන් දක්වා තිබීම මතභේදයට තුඩු දී තිබුණි. අදිවාසි සංරක්ෂණ වැඩසටහන දර්ශකයේ භෞතික කාර්යසාධනය සියයට 100 ක් ලෙස දක්වා තිබුණද ඊට අදාලව ප්‍රතිපාදන වෙන්කර හෝ ඊට අදාල කාර්යයන් ඉටුකර නොතිබුණි. | <u>දර්ශක 1 - දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන</u><br><br>දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන යටතේ පාසැල් ළමුන් ඉලක්ක කර ගනිමින් දේශන සංවිධානය කිරීම, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි. 2020.08.09 දින මෙම රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමේදී අයවැය ප්‍රතිපාදන යටතේ 401-3-3-2401 යටතේ රු.මි.1.2 ක මුදලක් මෙම අමාත්‍යාංශයේ වැය විෂයය යටතේ වෙන් කර තිබිණ. ඒ අනුව 2020 අවසන් කාර්තුව සඳහාද බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ක්‍රියාත්මක කළ අයුරින්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මූලිකව සැලසුම් කලද COVID 19 වසංගත තත්වය යටතේ පාසැල් වසා තිබූ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දුෂ්කර විය. පසුව අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි ළමුන්ගේ කලා රසඥතාව වර්ධනය කිරීම මෙන්ම පාරම්පරික සංස්කෘතිකාංග ඉදිරියට පවත්වාගෙන යාම අරමුණුකර ගනිමින් දහම් පාසැල් ළමුන් සඳහා හේවිසි භාණ්ඩ කට්ටල ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු මෙන්ම දහම් පාසැල් තෝරාගැනීමේ කටයුතුද අවසන් අදියර දක්වා ක්‍රියාත්මක කරන ලද අතර අවශ්‍ය සම්පත් දායකයින්ගේ සහාය ලබා දීමට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය එකඟතාවය පල කර තිබිණ. එසේ වුවද වර්ෂය අවසාන වීම නිසා ප්‍රතිපාදන නැවත භාණ්ඩාගාරය වෙත යැවීමට සිදු විය.<br><br>මූල්‍ය ප්‍රගතියක් ලගාකර ගත නොහැකි වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනෙකුත් සියලුම කටයුතු අවසන් කර තිබීම හේතුවෙන් භෞතික ප්‍රගතිය 75%ක් ලෙස දක්වා ඇත. | කාර්යසාධන දර්ශක ලඟාකර ගැනීමට අදාල කාර්යයන් ඉටුකිරීමට හා කාර්යසාධන වාර්තාව නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | <u>දර්ශක 2 - ආදිවාසී සංරක්ෂණ වැඩසටහන</u><br><br>වැය විෂයය අංක 401-2-3-1509 දඹාන ජන උරුම මධ්‍යස්ථානය නඩත්තු කිරීම ලෙස වෙන්වූ ප්‍රතිපාදන දඹාන ජන උරුම මධ්‍යස්ථානය වැටුප් ගෙවීම සඳහා වෙන් කර ඇත. මසකට රු.125,000 උපරිමයකට යටත්ව එම ගෙවීම සිදු කරනු ලබයි. ඒ අනුව 2020 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා ගෙවීම් මෙම අමාත්‍යාංශය යටතේ සිදු කර ඇත. මෙම ප්‍රතිපාදන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමේදී අමාත්‍යාංශ වැය විෂයය යටතට යටත් කර තිබූ ප්‍රතිපාදන වේ. දඹාන ජන උරුම මධ්‍යස්ථානය නඩත්තු කිරීම ලෙස වෙන් වී තිබූ මෙම ප්‍රතිපාදන එහි වැටුප් ගෙවීම සඳහා පමණක් භාවිතා කරන බැවින් සංවර්ධන ව්‍යාපෘති යටතට නොගැණුනි.<br><br>401-2-3-2001 ආදිවාසී ගම්මාන සංරක්ෂණය විෂය යටතේ වූ ප්‍රතිපාදන වල ප්‍රගතිය පමණක් 2020 කාර්යසාධන වාර්තාවේ 100% ක් ලෙස දක්වා තිබිණ. එහි 2020 වර්ෂය තුළ නිම කිරීමට නියමිතව තිබූ වැඩ කොටස නිම කිරීම අවසන් වීම නිසා භෞතික ප්‍රගතිය 100% ලෙස දක්වන ලදී. | |
| (ඇ) | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් ස්ථාපනය කරන ලද නව අමාත්‍යාංශයක් වූ බැවින් නව ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොකරන ලදී. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ජාතික උරුම අංශය මඟින් ක්‍රියාත්මක කරවීම සඳහා එම අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබූ ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කරන ලදී. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන කාර්යසාධන වාර්තාවේ දැක්වීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 62 ක්, තථ්‍ය සේවක සංඛ්‍යාව 20 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 40 ක් වුවද ඉහත පරිච්ඡේදයේ එය පිළිවෙලින් 58 ක්, 21 ක් හා 37 ක් ලෙස දක්වා තිබුණි. | මුද්‍රණය කිරීමේ දෝෂ හේතුවෙන් අනුමත කාර්යය මණ්ඩලය 58, 21 හා 37 ලෙස දක්වා ඇති අතර එය 62, 22 හා 40 ලෙස නිවැරදි විය යුතුය. | කාර්යසාධන වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) අනුකූලතා වාර්තාව යටතේ අනුකූල වන බවට දක්වා තිබූ අවශ්‍යතා 7 ක් අනුකූල නොවන බව විගණනයට නිරීක්ෂණය විය. | අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් ස්ථාපනය කරන ලද නව අමාත්‍යාංශයක් වූ බැවින් අවශ්‍ය කාර්යමණ්ඩලය නොමැති වීම, කාර්යාල උපකරණ නොමැති වීම මෙන්ම කාර්යාල පරිශ්‍රය ඉඩපහසුකම් නොමැති වීම යන අපහසුතා මත අමාත්‍යාංශයේ කාර්යයන් පවත්වාගෙන ගිය අතර අමාත්‍යාංශයේ කාර්යයන් පහසු කර ගැනීමට දළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. | කාර්යසාධන වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 04 ක් සඳහා 2021 ඔක්තෝබර් 04 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. | මානව සම්පත්වල පවතින ඌණතාවය හේතුවෙන් කටයුතු ප්‍රමාද වූ බව ද, ඉදිරියේදි නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාලසීමාව තුළ පිළිතුරු සැපයීමට කටයුතු කල යුතුය. |

**3.3 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන ගැසට් පත්‍රය මගින් ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණද කේන්ද්‍රය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි. කේන්ද්‍රය සඳහා අවශ්‍ය බවට තීරණය කර තිබූ 24 ක කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය හා බඳවාගැනීමේ පරිපාටි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු ලබා දී නැත. | ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීමට හා කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා සැලසුම් සකස්කර හෝ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගෙන හෝ නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙක් අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් කර නොමැති අතර මු.රෙ 71 මගින් ඉදිරියේදී එම තනතුර ඇති කිරිමට කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව දන්වමි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට හා අභ්‍යන්තර විගණනයන් සිදුකිරීමට කඩිනමින් පියවර ගත යුතුයි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 62 ක් වූ රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ 05 ක් තෘතීය මට්ටමේ 03 ක්, ද්විතියිය මට්ටමේ 23 ක් හා ප්‍රාථමික මට්ටමේ 11 ක් වශයෙන් තනතුරු 40 ක් පුරප්පාඩුව පැවතුණ අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ උපාධිධාරී පුහුණුවන්නන් 19 ක් සේවයේ යොදවා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අදාල ආයතන වෙත ලිපි ඉදිරිපත් කර ඇත. අභ්‍යාසලාභී උපාධිධාරී පුහුණුවන්නන් සඳහා ඉල්ලීමක් නොකල අතර ප්‍රාදේශීය ලේකම් කර්යාල මගින් රාජ්‍ය අමාත්‍යාංශට අනුයුක්ත කර ඇත. එම නිලධාරීන්ට වැටුප් ගෙවනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගිනි. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින තනතුරු පිරවීමට අවශ්‍ය පියවර ගත යුතු වීම අනුමත කාර්ය මණ්ඩලය තුල කටයුතු කල යුතු වීම. |